# සන්නස SANNASA

## ලියා දැන්වන වග

**ලොව ඉතා පැරණිම භාෂාවක් වන සිංහල භාෂාව ලොව ඇති විද්‍යාත්මක භාෂා දහයෙන් එකකි. මුවින් නිකුත් කළ හැකි සියළුම ආකාරයේ ශබ්ද ලිවීම සඳහා උචිත අක්ෂර මාලාවක් එහි තිබේ. උදාහරණයක් ලෙස දෙමළ භාෂාවෙන් ,ඛ, යන්න ශබ්ද කළ නොහැක.**

**සිංහල භාෂාව දත් අයෙකුට ඕනෑම භාෂාවක ඕනෑම වචනයක් පුහුණුවකින් තොරව ශබ්ද කළ හැක. එමෙන්ම ලෝකයේ කුමන භාෂාවක් වුවද සිංහල භාෂාව දත් පුද්ගලයාට ඉතා ඉක්මනින් ඉගෙන ගත හැක. සිංහල භාෂාවේ තරම් උපමා, උපමේය, සෑම ආකාරයකම කතාන්තර වෙන භාෂාවක නැත. මේවා තුළින් හැදෙන්නේ යහපත් දරුවෙකි. අවාසනාවකට නව අධ්‍යාපන ක්‍රම තුළින් මේ අවස්ථාව දරුවන්ගෙන් ඈත් කර තිබේ. ලෝකය ජයගත්තත් එම දරුවන් තුළ යහපත් ගුණධර්ම නැතිනම් ඉන් සමාජයට පලක් නැත. සෑම පහසුකමක්ම ඇති ලංකාව දිනෙන් දින පිරිහෙන්නේ එහෙයිනි. විදේශ රටක ජීවත් වුවද දරුවන්ගේ සිංහල භාෂාව ප්‍රගුණ කිරීමට දෙමාපියන් වගබලා ගත යුතුය.**

**සංස්කරණය / Editor**
චිත්‍රාන් මොරකන්දෙ ගමගේ

අනුශාසක **/ Advisor**
දෙනගම සිරිවර්ධන මහතා

**ග්‍රැෆික් නිර්මාණ කරනය**
**Graphic Design by**
**Crystal D** Digital Agency
www.crystald.com.au

**රූ රටා**
අතුල කල්දෙමුල්ල

**සේයා රූ**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂමන් කොඩිතුවක්කු
චික ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ
හර්ෂ කසුන්
ශනිල්ක නදීශාන්

**සම්බන්ධීකරණය**
**New South Wales**
ලක්ෂමන් කොඩිතුවක්කු
**Queensland**
ආනන්ද සමරතුංග
**Canberra**
අසෝක නිමලසිරි

**වෙළඳ දැන්වීම් / Advertising**
**Dilki : 0426 959 540**
info@sannasa.com.au
www.sannasa.com.au

**Sannasa Bank Account Details**
**Acc Name:**
Sannasa Media Group
**BSB:** 033 137 **AC:** 626 670

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා, ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න.




පසුගිය 21 වැනිදා යාපනය නගරයට හිරු උදාවන්නේ මුළු යාපනය අර්ධද්වීපයම උණුසුම් කරවූ ප්‍රවෘත්තියක් සමගය. 'ආවා ගෘෘප්' පාතාල කල්ලියේ සාමාජිකයකු පොලිස් නිලධාරියකු එල්ල කළ වෙඩි ප්‍රහාරයකින් මියයෑමේ සිද්ධිය ලැව් ගින්නක් මෙන් රට පුරා ප්‍රචාරය වන්නට ඒ තරම් කාලයක් ගතව තිබුණේ නැත.

මෙහි උණුසුම දෙගුණ තෙගුණ වී තිබුණේ ආවා කල්ලියේ සාමාජිකයකු පොලිස් වෙඩි පහරින් මියගිය මුල්ම අවස්ථාව වීම නිසාය. මානිප්පායි පොලිසියේ නිලධාරියකු එල්ල කළ වෙඩි ප්‍රහාරයකින් මියගොස් තිබුණේ 20 වැනි වියේ පසුවූ තරුණයෙකි.

අපොස උසස් පෙළ විභාගය ගණිත අංශයෙන් හැදෑරූ මේ තරුණයා පාසල් අධ්‍යාපන කටයුතු නිම කිරීමෙන් පසු ආවා පාතාල කල්ලිය සමග අත්වැල් බැඳගෙන සිටි අයෙකි.

පොලිසිය සමග ගැටුණු ආවා කල්ලියේ සාමාජිකයන් පිරිස එදින රාත්‍රියේ යමින් සිටියේ මානිප්පායි ප්‍රදේශයේ නිවාස දෙකකට පහරදී විනාශ කිරීමටය.

ආවා කල්ලියෙන් වෙන්වූ මැරයන් පිරිසකගෙන් සමන්විත ධනුරොක්ස් කල්ලිය යාපනය අර්ධද්වීපයේ වෙනම ආයතනයක් ගොඩනඟා ගනිමින් සිටියහ. මේ කල්ලියට නායකත්වය දුන් ධනුරොක් සහ කොලින්ගේ නිවාසවලට ප්‍රහාර එල්ල කිරීමට ආවා කල්ලියේ සාමාජිකයන් පැමිණෙන බවට මානිප්පායි පොලිසියට කල්තියාම තොරතුරක් ලැබී තිබුණේය.

මීට මාස කීපයකට උඩදී ධනුරොක්ස් කල්ලියේ සාමාජිකයන් පිරිසක් ආවා කල්ලියේ ක්‍රියාකාරී සාමාජිකයකුට යාපනය කොකුවිල් ප්‍රදේශයේදී මාරාන්තික ප්‍රහාරයක් එල්ල කර තිබුණේය.

ප්‍රහාරයට ලක්වූ ආවා කල්ලි සාමාජිකයා රැකියාව කළේ යාපනය කොකුවිල් දුම්රිය ස්ථානයේය.

මොහු ප්‍රහාරයට ලක්ව තිබුණේ කොකුවිල් දුම්රිය ස්ථානය අසල පිහිටි වෙළෙඳසලකදීය. තම කල්ලියේ සාමාජිකයකුට ප්‍රහාර එල්ල කිරීම පිළිබඳව ආවා කල්ලි සාමාජිකයන් තුළ හටගෙන තිබුණේ දැඩි නොසන්සුන්තාවකි. දකුණේ පාතාල කල්ලිවලට මෙන්ම උතුරේ පාතාල කල්ලි අතරද වෛරය පිරිමසා ගැනීම තදින්ම තිබුණේය.

කොකුවිල්වලදී තම සාමාජිකයකුට පහරදීමේ වාඩුව ගැනීමට ආවා කල්ලියට අවශ්‍ය විය. ආවා කල්ලිය යාපනය ප්‍රදේශයේ එක් එක් පළාත්වලට ව්‍යාප්තව තිබේ. ආවා කල්ලිය ප්‍රාදේශීය මට්ටමේ කණ්ඩායම් බිහිව තිබුණේය. ආවා කල්ලියේ කුඩා කණ්ඩායමක් චාවාකච්චේරිය ප්‍රදේශයේ ක්‍රියාත්ම වුණේය. ඒ කල්ලිය හැඳින්වූයේ 'චාවා ගෘෘප්' යනුවෙන්ය.

ධනුරොක්ස්ගේ සහ කොලින්ගේ නිවාසවලට ප්‍රහාර එල්ල කිරීමේ කාර්ය භාරගෙන තිබුණේ චාවා ගෘෘප් කල්ලිය විසින්ය. මේ කල්ලියට අයත් සාමාජිකයන් හය දෙනෙක් අති සුඛෝපභෝගී යතුරුපැදි හතරක නැගී තියුණු ආයුධවලින් සන්නද්ධව මානිප්පායි ප්‍රදේශයට පැමිණෙන්නේ 20 වැනිදා රාත්‍රියේදීය.

'චාවා ගෘෘප්' කල්ලියේ සාමාජිකයන් පැමිණෙන මාර්ගයේ පොලිස් නිලධාරීන් හදිසි මාර්ග බාධකයක් යොදා තිබුණේය. මග රැක සිටි පොලිස් නිලධාරීන් දුටු සැණින් චාවා ගෘෘප් කල්ලියේ සාමාජිකයන් අන්ද මන්ද වූහ.

මානිප්පායි පොලිසියේ නිලධාරියකු විදුලි පන්දමක් දල්වාගෙන යතුරුපැදිවල සිටි තරුණයන් ආසන්නයට ආවේ ඔවුන් පරීක්ෂා කිරීමටය. තමන්ට කිසිම ගැලවීමක් නැති බව දැන සිටි චාවා ගෘෘප් කල්ලියේ සාමාජිකයකු තමන් අසලට එන පොලිස් නිලධාරියාට තියුණු ආයුධයකින් පහරදීමට උත්සාහ ගත්තේය.

පොලිස් නිලධාරීන් කීප දෙනෙකු අඳුරේ සැඟව සිටින බව චාවා කල්ලියේ සාමාජිකයන් දැන සිටියේ නැත. තම සහෝදර නිලධාරියාට පහර දීමට උත්සාහ කරන පාතාල සාමාජිකයාට වෙඩි තැබීමට ඒ පොලිස් නිලධාරීන් දෙවරක් සිතා බැලුවේ නැත. වෙඩි ප්‍රහාරයෙන් ආවා කල්ලියේ සාමාජිකයා ඒ ස්ථානයේම මියගියේය. විශේෂත්වය වන්නේ මේ ප්‍රහාරය එල්ල කළ පොලිස් නිලධාරියාද යාපනයේම පදිංචි දෙමළ ජාතික නිලධාරියෙකි.

ආවා පාතාල කල්ලියේ සාමාජිකයකු පොලිස් වෙඩි ප්‍රහාරයකින් මියයෑමේ ප්‍රවෘත්තිය